# පොලිස්පති නිල කාර්යාලය

සීආර්ටීඑම් : (　　　) - ආර්ටීඑම් : ( 882 )

2021.05.20

පොලිස්පති ගෙන් 　　　සියලු ම : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්
: නියෝජ්‍ය පොලිස්පතිවරුන්
: අණදෙන නිලධාරීන් / අධ්‍යක්ෂවරුන්
: ප්‍රාදේශීය කොට්ඨාස භාර නිලධාරීන්
: දිස්ත්‍රික් භාර ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිවේදිත නිලධරයන්
: මූ.පො.ප. / ස්ථානාධිපතිවරුන් වෙත

**දිවයින තුළ සංචරණ සීමා පැනවීම**

**2021.05.21 දින පැය 2300 සිට 2021.05.25 දින පැය 0400 දක්වා**

**2021.05.25 දින පැය 2300 සිට 2021.05.28 දින පැය 0400 දක්වා**

දිවයින තුළ පහත දක්වා ඇති පරිදි සංචරණ සීමා පනවන බවට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිවේදනය කර ඇත.

i. 2021.05.21 වන සිකුරාදා දින පැය 2300 සිට 2021.05.25 වන අඟහරුවාදා දින පැය 0400 දක්වා

ii. 2021.05.25 වන අඟහරුවාදා දින පැය 2300 සිට 2021.05.28 වන සිකුරාදා දින පැය 0400 දක්වා

2. ඒ අනුව සෑම පොලිස් බල ප්‍රදේශයක් ම ආවරණය වන පරිදි මෙම සංචරණ සීමා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර මූ.පො.ප./ ස්ථානාධිපතිවරුන් විසින් ගත යුතු අතර, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිවේදිත නිලධරයන් විසින් එම සීමා ඵලදායී ලෙස සහ අර්ථවත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීමට ක්‍රියා කළ යුතු ය.

3. මෙම සංචරණ සීමා පැනවීමේ අරමුණ වන්නේ රටේ නිෂ්පාදන, කෘෂිකර්ම හා අපනයන කටයුතු වලට මෙන් ම ජනජීවිතය පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වූ සේවාවන් පවත්වාගෙන යාමට සහ මහජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂණය පිළිබඳව ගනු ලබන පියවරයන්ට බාධා නොවන පරිදි අනවශ්‍ය සංචරණයන් සීමා කිරීම වේ.

4. ඒ අනුව මෙම සංචරණ සීමා තම පළාත, දිසාව, කොට්ඨාස හා දිස්ත්‍රික්ක බල ප්‍රදේශ තුළ ක්‍රියාත්මක කිරීමේ දී එම අරමුණ යථා පරිදි හා ඵලදායීව ඉටුවන ලෙස අවශ්‍ය තීරණ ගැනීම සහ උපදෙස් ලබාදීම එම ප්‍රදේශ අධීක්ෂණය කරන ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිවේදිත නිලධරයන් ගේ වගකීම බව අවධාරණය කරමි.

තැ. පෙ. 517, පොලිස් මූලස්ථානය, කොළඹ - 01, ශ්‍රී ලංකාව
දු.ක. 2421750, 2421111 - දිගුව : 3000 ෆැක්ස් : 2446174 ඊ-මේල්: igp@police.lk

5. පහත සඳහන් කටයුතු සඳහා සංචරණ සීමා අදාළ නොවිය යුතු ය.

i). ෆාමසි, රෝහල්, දේශීය හා බටහිර වෛද්‍ය ආයතන පවත්වාගෙන යාම.
ii). සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාම.
iii). ගිණි නිවීමේ සේවා පවත්වාගෙන යාම.
iv). තානාපති අංශ, නීතිපති දෙපාර්තමේන්තුව, අධිකරණ කටයුතු.
v). දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල කටයුතු.
vi). දේශීය නිෂ්පාදන, කර්මාන්ත ශාලා සහ අපනයන කර්මාන්ත ශාලා පවත්වාගෙන යාම.
vii). සංවර්ධන කටයුතු වලට අදාළ ව්‍යාපෘති හා වැඩබිම් පවත්වාගෙන යාම.
viii). අපනයන භෝග, වාර්ෂික භෝග ඇතුළු ගොවිතැන් කටයුතු පවත්වාගෙන යාම.
ix). ජලය, විදුලිය, ඉන්ධන, දුරකථන ඇතුළු අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාම.
x). සත්ව නිෂ්පාදන, සත්ව නිෂ්පාදන ආශ්‍රිත සැපයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම.
xi). ගොවිපල සහ සත්ව උද්‍යාන පවත්වාගෙන යාම.
xii). කෘෂි නිෂ්පාදන බෙදා හැරීම සහ ආශ්‍රිත සැපයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම.
xiii). මත්ස්‍ය නිෂ්පාදන බෙදා හැරීම සහ ආශ්‍රිත සැපයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම.
xiv). පිසූ ආහාර සහ ආහාර ද්‍රව්‍ය නිවෙස් වෙත බෙදා හැරීමේ සේවා (Delivery Service) පවත්වාගෙන යාම.
xv). සුපිරි වෙළඳ සැල්, සමූපකාර වෙළඳ සැල් ආදිය මගින් භාණ්ඩ නිවෙස් වෙත බෙදා හැරීමේ සේවා (Delivery Service) පවත්වාගෙන යාම සහ ඒ සඳහා අවශ්‍ය වන අභ්‍යන්තර කටයුතු පවත්වාගෙන යාම.
xvi). ධීවර නිෂ්පාදන, බේකරි නිෂ්පාදන, එළවළු ආදී භාණ්ඩ ජංගම රථ මගින් නිවෙස් වෙත බෙදා හැරීම.
xvii). ගුවන් තොටුපල සේවා, ප්‍රවාහන සේවා, දුම්රිය සේවා, වරාය කටයුතු ඇතුළු අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාම.
xviii). ගුවන් තොටුපලට යාම හා ආපසු ඒම / විදේශයන්හි සිට ලංකාවට පැමිණි තැනැත්තන් නවාතැන් ගන්නා ස්ථාන වෙත යොමු කිරීම.
xix). ඉදි කිරීමේ වැඩබිම් පවත්වාගෙන යාම.
xx). පෞද්ගලික ආරක්ෂක සේවා ක්‍රියාත්මක කිරීම.
xxi). මාධ්‍යවේදීන් සහ මාධ්‍ය ආයතනවල කටයුතු කිරීම.

6. පහත සඳහන් කටයුතු පවත්වාගෙන යාම සඳහා අවසර නොලැබේ.

i). සුපිරි වෙළඳසැල් ඇතුළු සියලු ම වෙළඳ ආයතන හා කඩ සාප්පු විවෘත කර භාණ්ඩ අලෙවි කිරීම.
ii). සියලු ම බීමහල් ඇතුළු සමාජ ශාලා
iii). අවන්හල් ඇතුළු බාහිර සේවා සපයන හෝටල්
iv). අත්‍යවශ්‍ය සේවා හැර අනෙකුත් සියලුම ආයතන හා කාර්යාල
v). සතිපොළ සහ වෙළඳ කුටි
vi). සිනමා ශාලා ඇතුළු ජනතාව එක්රැස් වන කටයුතු

7. මෙය නිරෝධායන ඇඳිරි නීතිය පැනවීමක් නොවන අතර, සංචරණය සීමා කිරීමක් වන හෙයින් ඇඳිරි නීති බලපත්‍ර හෝ වෙනත් බලපත්‍ර නිකුත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. <u>**එමෙන් ම ඉහත සඳහන් සේවා හෝ අත්‍යවශ්‍ය වූ වෙනත් සේවා හෝ කාර්යයක් සඳහා සංචරණය කරන තැනැත්තකු හඳුනා ගැනීමෙන් පසු බාධාවකින් තොරව ගමන් කිරීමට අවසර දීමට කටයුතු කළ යුතු ය.**</u>

8. ඉහත දක්වා ඇති උපදෙස් ක්‍රියාත්මක කිරීමේදී මු.පො.ප./ ස්ථානාධිපතිවරුන්ට යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වුවහොත් තම ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිවේදිත නිලධරයන්ගෙන් එම පැහැදිලි කර ගැනීම කරගත යුතු අතර, කොට්ඨාස භාර නිලධාරින් විසින් නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතාගෙන් යම් පැහැදිලි කිරීමක් කර ගත හැකි බව ද දන්වා සිටිමි.

සී.ඩී. වික්‍රමරත්න
පොලිස්පති

ී. ඩී. වික්‍රමරත්න
ොලිස්පති
ොලිස් මූලස්ථානය
කොළඹ 01

පිටපත : ගොනුවට
මං/-